# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

# ප්‍රසම්පාදන දැන්වීමයි

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්යය මණ්ඩලය සඳහා නිල ඇඳුම් / නිල ඇඳුම් රෙදි ප්‍රසම්පාදනය

### ලංසු අංකය - PR/02/11-03

විදේශ කටයුතු විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් SLBFE කාර්යය මණ්ඩලය සඳහා නිල ඇඳුම් සහ නිල ඇඳුම් රෙදි සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

අවශ්‍යතාවයන් පිළිබඳ සවිස්තරාත්මක විස්තර සහ රෙදි පිරිවිතරයන් ලංසු ලිපි ලේඛනයෙහි සපයා ඇත.

| | අයිතම විස්තරය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| 1 | කලිසම් රෙදි (කාර්යය මණ්ඩල කාණ්ඩ තුනක්) | මීටර් 2125 |
| 2 | කමිස- අත් දිග (කාර්යය මණ්ඩල කාණ්ඩ දෙකක්) | 1662 |
| 3 | කමිස- අත් කොට (කාර්යය මණ්ඩල කාණ්ඩ එකක්) | 888 |
| 4 | හැට්ට රෙදි සමග සාරිය (කාර්යය මණ්ඩල කාණ්ඩ තුනක්) | 3384 |

**කාර්යයෙහි විෂය පථය**

ලංසු ලිපි ලේඛනයෙහි දක්වා ඇති පරිවිතරයන්ට සහ අවශ්‍යතා උපලේඛනයට අනුකූලව නිල ඇඳුම් රෙදි සහ මසා නිමකළ නිල ඇඳුම් සැපයීම

01. ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටිය (NCB) අනුව ලංසුකරණය මෙහෙයැවේ.

02. සාර්ථක ලංසුකරු/ ලංසුකරුවන්, දින 120ක් ඇතුළත ප්‍රසම්පාදනය සම්පූර්ණ කළ යුතුය.

03. ලංසු අවසන් කරනු ලබන දිනයේ සිට ලින් දින එකසිය විස්සක් (120) දක්වා ලංසු වලංගු විය යුතුය.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරු/ ලංසුකරුවන් පහත දක්වෙන අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය. අතිරේක විස්තර ලංසු ලිපි ලේඛනයෙහි සපයා ඇත.

   අ) ලංසුකරු/ ලංසුකරුවන් වසර 6ක් හෝ වැඩි කාලයක් සඳහා ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් විය යුතුය. ලංසුකරු කිසිදු රාජ්‍ය සංවිධානයක් මගින් අසාධු ලේඛනගත (දේශීයව හෝ ජාත්‍යන්තරව) නොකර තිබිය යුතුය.

   ආ) පසුගිය වසර පහක (2019-2024) කාලය තුළ සමාන ස්වභාවයේ ව්‍යාපෘති අවම වශයෙන් 2ක් ඉටුකළ/ ඉටුකරමින් පවතින පළපුරුද්දක් ලංසුකරු/ ලංසුකරුවන් සතුවිය යුතුය. එවැනි ව්‍යාපෘති එකක අවම වටිනාකම ලංකා රුපියල් මිලියන 15ට නොඅඩු විය යුතුය. (සනාථ කිරීමේ සාක්ෂි ලංසු ලිපි ලේඛන සමග සැපයිය යුතුය.)

   ඇ) පසුගිය වසර 5ක කාලය සඳහා ලංසුකරු/ ලංසුකරුවන් සතුව ශ්‍රී ලංකා රුපියල් මිලියන දෙසීයක (ලං. රු. මිලියන 200) හෝ ඉහළ අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුමක් තිබිය යුතුය. (සනාථ කිරීමේ සාක්ෂි ලංසු ලිපි ලේඛන සමග සැපයිය යුතුය.)

   ඈ) ලංසුකරුට/ ලංසුකරුවන්ට, නිෂ්පාදන නිෂ්පාදකයා විසින් ඔවුන්ව දේශීය නියෝජිත ලෙස පත් කරමින් බලය පැවරූ ලිපිය ඉදිරිපත් කිරීමේ හැකියාව තිබිය යුතු. (නිදර්ශක ලිපි ආකෘතියක් ලංසු ලිපි ලේඛන සමග අමුණා ඇත.)

05. යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු 2025.07.14 සිට 2025.08.03 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 අතරතුර බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, අංක 234, 2 වන මහල, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කළමනාකරු- ප්‍රසම්පාදන වෙතින් ලබාගත හැක. ලංසුකරුවන්ට 2025.07.14 සිට 2025.08.03 දින දක්වා වැඩ කරන දිනයන් හිදී කාර්යාලයීය වේලාව තුළදී ඉහත ලිපිනයේ ප්‍රසම්පාදන අංශයේදී ලංසු ලිපි ලේඛන ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කොට බැලිය හැක.

   දුරකථන : 011-2887585 ඊමේල් : **mgr_procurement@slbfe.lk**

06. නැවත නොගෙවන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් තිස්දහසක් (ලංරු. 30,000/-) ගෙවීමෙන් අනතුරුව බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, අංක 234, 2 වන මහල, ප්‍රසම්පාදන අංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ, සභාපති වෙත, සමාගමේ ලිපි ශීර්ෂයක ලියන ලද ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් 2024.07.14 සිට 2025.08.03 දින දක්වා කාර්යාල වැඩ කරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 අතරතුර කාලයේදී අභිලාෂී ලංසුකරුට/ කරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් මුදලින් පමණක් කළ යුතුය.

   ලංසුකරු/ ලංසුකරුවන්, ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ (BRC) මුල් පිටපත, අනුපිටපතක් සහිතව ඔවුන්ගේ ඉල්ලීම් ලිපියට අමුණා එවිය යුතුය. BRC මුල් පිටපත සත්‍යාපනය කර ගැනීමෙන් පසු එදිනම ආපසු දෙනු ලැබේ.

07. 2025.08.04 දින ප.ව. 2.00ට ලංසු භාරගැනීම අවසන් කෙරෙන අතර, ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වීම සඳහා ලංසුකරුට හෝ ඔහුගේ/ ඇයගේ නියෝජිතයාට අවසර ලැබේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**

**දුරකථන/ ෆැක්ස් 011-2880550/ 2 880564 / 2 887585.**
**ඊමේල් : mga_procurement@slbfe.lk**
**එතෙර සවියට මෙතෙර අත් වැළ**

"එතෙර සවියට මෙතෙර අත්වැල"